# මරණ ලියාපදිංචිය

## <u>නිවසක සිදුවූ මරණයක් ලියාපදිංචි කිරීම</u>

- මරණය සිදුවී දින 07ක් ඇතුලත ග්රාුම නිලධාරී වෙත දැනුම් දෙන්න.
- ග්රා ම නිලධාරී විසින් මරණය පිළිබඳව වාර්තාවක් ප්රරදේශයේ රෙජිස්ට්රාොර් වෙත යවනු ලැබේ.
        - මරණය ලියාපදිංචි කරනු ලබන්නේ මරණය සිදුවූ ප්ර දේශයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්රාදර් වරයා විසිනි. මරණ ප්රකකාශය රෙජිස්ට්රාමර් වරයාගෙන් ලබාගත හැක.
        - දැනුම් දීමට සුදුසුකම් ලත් පුද්ගලයන්
        - මරණය සිදුවන අවස්ථාවේදි එහි සිටි කිට්ටුම නෑදෑයා
        - අවසන් වරට රෝගීව සිටියදී උපස්ථානය කළ කිට්ටුම නෑදෑයා
        - එවැනි නෑදෑයකු නොමැතිවූ විට
    - මියගිය අය පදිංචි රෙජිස්ට්රානර් කොට්ඨාශය තුල වාසය කරන මියගිය තැනැත්තාගේ නෑදෑයකු
        - එවැනි නෑදෑයකු නොමැතිවූ විට
            - මරණය සිදුවන අවස්ථාවේ එහි සිටි පුද්ගලයෙක්
            - මරණය සිදුවූ ගෙදර පදිංචිකරු
        - ඉහත සඳහන් පුද්ගලයන් නොමැතිවූ විට
    - මළ සිරුර වැළලීමට, ආදාහනය කිරීමට හෝ වෙනත් ආකාරයකින් ඒ පිළිබඳ අවසන් කටයුතු කරන පුද්ගලයා
- මරණය සිදු වී මාස 03ක් ඇතුලතදී මරණය නොමිලයේ ලියාපදිංචි කරවා ගත හැක. මරණය සිදු වී මාස 03කින් පසුවද මරණය ලියාපදිංචි කරවා ගැනීමට හැකියාව ඇති අතර ඒ සඳහා කල් ගත වූ මරණ ලියාපදිංචි කිරීමේ විස්තර බලන්න.
- දැනුම් දෙන්නා වෙත නොමිලයේ මරණ සහතිකයක් නිකුත් කරනු ලැබේ.

# <u>රෝහලක සිදුවූ මරණයක් ලියාපදිංචි කිරීම</u>

- මරණයක් ලියාපදිංචි කරන්නේ මරණය සිදු වූ ප්රදේශයේ සිටින උප්පැන්න හා මරණ රෙජිස්ට්රාර්වරයා විසිනි. මරණය සිදු වූයේ ග්රාවමීය රෝහලක නම් එම ප්රදේශයේ සිටින රෙජිස්ට්රාසර්වරයාට මරණය ලියාපදිංචි කිරීමට දැනුම් දෙන්න.
- මරණය ලියාපදිංචි කිරීම සඳහා දැනුම් දීමට සුදුසුකම් ලත් පුද්ගලයන්
    - මරණය සිදුවූ වේලාවේ එහි සිටි පුද්ගලයන්
    - මරණය සිදුවන වේලාවේ උපස්ථාන කළ පුද්ගලයා
    - රෝහලේ වෛද්‍ය  නිලධාරී
- මරණය දැනුම් දීම සඳහා අවශ්ය ප්රසකාශය, උප්පැන්න හා මරණ රෙජිස්ට්රාර්වරයාගෙන් ලබාගන්න.
- ඉදිරිපත් කළයුතු ලියවිලි,
    - නිවැරදිව සම්පූර්ණ කරන ලද ප්රලකාශය
    - මරණය සිදු වූ බව තහවුරු කිරීමට රෝහලෙන් නිකුත් කළ වාර්තාව
- මාස 03ක කාල සීමාවක් ඇතුලතදී මරණයක් නොමිලයේ ලියාපදිංචි කරවා ගත හැක.
- දැනුම් දෙන්නා වෙත නොමිලයේ මරණ සහතික පිටපතක් නිකුත් කරනු ලැබේ.
- වැඩිදුර විස්තර අවශ්යම වන්නේ නම් ළඟම පිහිටි ප්රාදේශීය මහ ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්රිරික් රෙජිස්ට්රාරර්වරයා හමුවන්න.

# <u>කල්ගතවූ මරණයක් ලියාපදිංචි කිරීම</u>

- මරණයක් සිදුවී මාස තුනක් ඇතුලත දී ලියාපදිංචි කර නොමැති විටෙක එවැනි මරණයක් ලියාපදිංචි කරවා ගැනීමට පුළුවන.
- එම ප්‍රකාශය කර තිබෙන්නේ එහි සඳහන් මරණය සිදුවී අවුරුදු 25 කට වැඩි නොවන කාලයක් තුලදී නම් පමණක් මරණය ලියාපදිංචි කළ හැක.
- ප්රරකාශ පත්රහය මරණය සිදුවූ ප්රිදේශයේ ප්රානදේශීය ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රි◌ාක් රෙජිස්ට්‍රාපර්ට ඉදිරිපත් කරන්න.
- <u>ප්‍රකාශ පත්‍රය</u> ඉදිරිපත් කළ හැකි පුද්ගලයන්
    - මරණයක් සිදුවන අවස්ථාවේ එහි සිටි හෝ මියගිය තැනැත්තා අවසන් වරට රෝගීව සිටියදී ඔහුට උපස්ථානය කළ කිට්ටුම නෑදෑයා
    - උනන්දුවක් දක්වන වෙනත් අය
- ප්‍රකාශ පත්‍ර ය සඳහා ගාස්තුව රු. 50.00 කි.

# මරණ සහතික පිටපතක් ලබා ගැනීම

- මරණ සහතිකයේ පිටපත් ලබාගත යුත්තේ මරණය සිදුවූ ප්‍රදේශය අයත් වන ප්‍රාකදේශීය ලේකම් කාර්යාලයෙනි.
- අවශ්‍යන ඉල්ලුම් පත්‍ර ය ඕනෑම ප්‍රාපදේශීය ලේකම් කාර්යාලයක දිස්ත්‍රිශක් රෙජිස්ට්‍රාර් අංශයෙන් ලබාගත හැක.
- අයකරනු ලබන ගාස්තු,
    - මරණ සහතිකයේ අංකය සහ ලියාපදිංචි කළ දිනය දන්නා විට එක පිටපතකට ගාස්තුව රු.100.00
    - මරණ සහතිකයේ අංකය සහ ලියාපදිංචි කළ දිනය නොදන්නේ නම් එක පිටපතකට ගාස්තුව රු.200.00
- අවශ්‍යා මුදල් ප්‍රා.දේශීය ලේකම් කාර්යාලයට ගෙවන්න.
- සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දෙන්න.
- මරණ සහතිකය තැපෑලෙන් ගෙන්වා ගැනීමට අවශ්‍යය වේ නම් ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ ලියුම් කවරයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරන්න.